# ජනාධිපති ලේකම් කාර්යාලය

# විශ්ලේෂක පුරප්පාඩු

**මේ ඔබ ද?**

රටේ පවතින ප්‍රධාන ගැටලුවලට විසඳුම් සෙවීමට ඔබගේ නිපුණතාවය භාවිත කිරීම සඳහා ඔබ කැමැත්ත දක්වන්නේ ද? සාර්ථකත්වය සඳහා එකම මාර්ගය දත්ත මත පදනම් වූ ප්‍රතිපත්ති බව ඔබ විශ්වාස කරන්නේ ද? විචිත්‍රවත් වූ ප්‍රජාතන්ත්‍රවාදයක් තුළ දත්ත පදනම් වූ විසඳුම් සහ ශක්තිමත් ප්‍රතිපත්ති ධාරාවක් නිර්මාණය කිරීමේ ක්‍රියාවලියේ නිරත වීමට ඔබට අවශ්‍ය ද?

**අප ගැන**

ජනාධිපති ලේකම් කාර්යාලයේ විශ්ලේෂක කණ්ඩායම, රටේ ආර්ථික සංවර්ධනය සහ මහජන සුභසිද්ධියට සම්බන්ධව එදිනෙදා පැනනගින සැබෑ සහ අභියෝගාත්මක ගැටලුවලට සාර්ථක ව මුහුණ දිය හැකි තරුණ පිරිසකින් සමන්විත වේ.

**අප සොයන්නේ**

පහත සඳහන් සුදුසුකම් සහිත ස්වයං ධාවනයකින් යුත් පුද්ගලයින් වේ.

- දත්ත විද්‍යාව/සංඛ්‍යානය/පරිගණක විද්‍යාව/ආර්ථික විද්‍යාව/ප්‍රතිපත්ති අධ්‍යයනය හෝ මෙයට අදාළ වෙනත් ක්ෂේත්‍රයක උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයක සමාන අධ්‍යයන සුදුසුකම්.
- දත්ත පිළිබඳ ව මනා බුද්ධියක් සහිත ශක්තිමත් විශ්ලේෂක නිපුණතාවය, දත්ත රැස් කිරීම/කැණීම (mining), ආර්ථිකමිතිය, ගණිතමය ආකෘති නිර්මාණය, දත්ත ගබඩා කිරීම සහ දත්ත දෘශ්‍යකරණය පිළිබඳ පළපුරුද්ද විශේෂයි.
- ලිඛිත සහ වාචික සන්නිවේදනය පිළිබඳ විශිෂ්ට කුසලතාවය.

**ඔබට පැවරෙන කාර්යයන්**

- ඔබ විසින් ගැටලු හඳුනාගැනීම සහ විසඳුම් සැලසුම් කිරීමේ කාර්යයන්වල දී රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන රාශියක් සමඟ සම්බන්ධ වී කටයුතු කරනු ඇත.
- දත්ත හඳුනා ගැනීම සහ බහුවිධ මූලාශ්‍රවලින් දත්ත රැස් කිරීම සහ අභ්‍යන්තර දත්ත සමුදායන් සංවර්ධනය කිරීමට කටයුතු කරනු ඇත.
- සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්ති සැකසීමේ ක්‍රියාවලියේ විශ්ලේෂණාත්මක හරය වන දත්ත සම්බන්ධතා සකස් කිරීම සහ විශ්ලේෂණය කිරීම (Wrangling and analyzing) සිදු කරනු ඇත.
- ඔබගේ සොයාගැනීම් සහ නිර්දේශ ඉදිරිපත් කරනු ඇත.

**ප්‍රතිලාභ**

මේ සඳහා ආකර්ෂණීය වැටුප් පැකේජයක් හිමි වුවත් හුදෙක් මූල්‍ය ප්‍රතිලාභවලට වඩා අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වඩාත් ඇල්මක් සහ අරමුණක් සහිත පුද්ගලයින් බඳවා ගැනීම අපගේ අපේක්ෂාවයි. කොන්ත්‍රාත් කාලය මූලික ව වසරක කාලයක් වේ.

**අයදුම් කිරීම**

ඔබ මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන සුදුසුකම් සහිත පුද්ගලයෙකු නම්, නොපමාව ppd@presidentsoffice.lk යන විද්‍යුත් ලිපිනයට ඔබගේ අයදුම්පත යොමු කරන්න.

**අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය : මෙම දැන්වීම පළ කළ දින සිට දින 7 ක් ඇතුළත**

**ජනාධිපති ලේකම් කාර්යාලය**

**ගාලු මුවදොර, කොළඹ 01.**